# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2110/3 - 2019 පෙබරවාරි මස 11 වැනි සඳුදා - 2019.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

DIK/LAN/02/30/39.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දික්වැල්ල උතුර ග්‍රාම නිලධාරී වසමේ වලස්ගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි. මාර 2767 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: පොල්ගහහේන; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: මිරිස්ස ගජමන්ගේ සුසිල් ප්‍රේමරත්න සහ මිරිස්සෙ ගජමන්ගේ නාලනී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0223.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: පොල්ගහහේන; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: වලස්ගල, දෙමටපිටිය, පොල්ගහහේන, අංක 468හි පදිංචි මුතුකුමාරණ හේවා තොණ්ඩිලගේ සිරිපාල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0158.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2019.03.07 වැනි දින පෙ.ව.10.30 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019.02.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතව ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2019 ජනවාරි මස 30 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

03 - 06

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* ආර්බීකේ/එල්ඒඑන්/ඒකිව්යූආර්ඊ/ඒ3/65/171.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/7/2016/HW/07.

අංක 1990/19 හා 2016.10.26 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* III වන කොටසෙහි සඳහන් අ.ග.පි. 134 අතිරේක 01 කැබලි 171 ඇතුළත් කර සංශෝධනය කිරීම.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය සකස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 2ඩී, කුඩාගම දකුණ හා අංක 3 නත්තඹුර ග්‍රාම නිලධාරි වසම්වලට අයත් බමුණාඋල්ල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 134, අතිරේක අංක 1, පත්‍ර අංක 2 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 171**

ඉඩමේ නම: අඹගහමුලවත්ත; විස්තරය: ගෙවත්ත, හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ඒ. පී. අතපත්තු බණ්ඩාර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0069.

*ඉහත සඳහන් ඉඩමට මායිම්:*

*උතුරට*: කැබලි අංක 11; *නැගෙනහිරට*: කැබලි අංක 172; *දකුණට*: කැබලි අංක 174 සහ 169; *බටහිරට*: කැබලි අංක 169, 168 සහ 11.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව.10.00 ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019 පෙබරවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,<br>ප්‍රාදේශීය ලේකම්,<br>රඹුක්කන.

2019 පෙබරවාරි මස 01 වැනි දින,<br>රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 07

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.